**SAVINGS**

# AIA SMART WEALTH



## ඔබේ ධනය වර්ධනය හා
## ආරක්ෂා කරන සැලැස්මක්

HEALTHIER, LONGER,
BETTER LIVES

aialife.com.lk

ඔබේ ධනය ඕනෑම දෙයක් වෙනුවෙන් ඔබට වැය කළ හැක. එය උසස් ජීවන රටාවක්, මූල්‍ය ආරක්ෂාව හෝ විශ්‍රාමයට පවා විය හැකිය. ඔබේ ධනය ආරක්‍ෂා කිරීම සඳහා අපි ඔබ වෙනුවෙන්ම AIA ස්මාට් වෙල්ත් සැලසුම නිර්මාණය කළෙමු.

AIA ස්මාට් වෙල්ත්, ජීවිතයේ සුන්දර මෙන්ම අසීරු අවස්ථාවන් වලදීත් ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් එක ලෙස ආරක්‍ෂා කරන්නට හැකි වන පරිදි සැකසූ නම්‍යශීලී සැලැස්මකි.

## AIA SMART WEALTH මගින් ඔබ වෙත පිරිනැමෙන ප්‍රතිලාභ

**කෙටි කාලීන වාරික ගෙවීමේ කාලසීමාවක් සඳහා දිගු කාලීන රැකවරණය**

ඔබ විසින් වාරික ගෙවිය යුත්තේ වසර 4 හෝ 6 ක කාලයක් පමණි. එමගින් ඔබ වෙත වසර 20 ක් දක්වා අඛණ්ඩව රැකවරණය සැලසේ.

**කල්පිරීමේදී එකවර මුළු මුදල හෝ Dividend Booster (ලාභාංශ වර්ධකය) සමඟින් ඉහළ මාසික වැටුප් ආදායමක්**

ඔබ විසින් නිසි කලට වාරික ගෙවීම සිදුකරනු ලබන්නේනම් කල්පිරීමේ ප්‍රතිලාභය එකවර සම්පූර්ණයෙන් ලබාගැනීමට ඔබට හැකියි. නැතිනම් වසර 5 - 30 කාලසීමාවක් සඳහා මාසික ආදායමක් වශයෙන් එය ලබාගැනීමේ අවස්ථාව ඔබ සතුයි. ඔබ මාසික ආදායමක් ලබාගැනීමට තෝරාගතහොත් ඔබට ලැබෙන ලාභාංශ ප්‍රතිශතය අදාළ වර්ෂය සඳහා ප්‍රකාශිත ලාභාංශ ප්‍රතිශතයට වඩා 30% කින් වැඩි වේ.

**ආකර්ෂණීය ප්‍රසාද තිළිණ**

ඔබේ ඔප්පුවේ 15 වන හා 20 වන වසරේදී ඔබේ මූල්‍යමය කැපවීමට ලෝයල්ටි රිවෝර්ඩ්ස්.

**ඔබේ පවුල වෙත ජීවිත රක්ෂණ ප්‍රතිලාභයක්**

කිසියම් අවාසනාවන්ත ආකාරයකින් ඔබ වියෝ වුවහොත්, ඔබෙන් යැපෙන්නන් වෙත කඩිනමින් ජීවිත රක්ෂණ ප්‍රතිලාභය හිමි වේ (පළමු රක්ෂණවර වසර තුළ ඔබ වියෝ වුවහොත්, ඔබේ මූලික වාර්ෂික වාරිකය මෙන් 120% ක් ඔබගේ යැපෙන්නන් වෙත හිමි වේ).

**ඔබ ජීවතුන් අතර නොසිටියද ඔබේ පවුලට අරමුදලක්**

වාරික ගෙවීමේ කාලසීමාව තුළ ඔබ වියෝ වුවහොත් හෝ පූර්ණ සහ සදාකාලික අකර්මණ්‍යතාවයකට පත් වුවහොත් AIA මගින් ඔබ වෙනුවෙන් ඔබේ වාරික ගෙවමින්, ඔබේ රක්ෂණාවරය අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. එමනිසා ඔබ විසින් ඔවුන් සඳහා ගොඩනංවන ලද අරමුදලෙහි ප්‍රතිලාභ අත්විඳීමේ අවස්ථාව ඔබේ පවුල වෙත හිමි වේ.

**හදිසි අවස්ථාවකදී මුදල් ආපසු ගැනීමේ හැකියාව**

ඔබේ රක්‍ෂණ ඔප්පු කාල සීමාව ඇතුළත එක්වරකදී ඔබේ අරමුදලෙන් 15% දක්වා ආපසු මුදල් ලබාගැනීමේ හැකියාව (වාරික ගෙවිය යුතු කාල සීමාවෙන් පසු).

## AIA SMART WEALTH වෙතින් සහතික කරන ලද ලාභාංශ

AIA SMART WEALTH වෙතින් සුවිශේෂී ලාභාංශ ක්‍රමයක් ඉදිරිපත් කෙරෙන අතර, එමගින් එක් එක් වසරේදී ඔබේ අරමුදලෙහි අඛණ්ඩ වර්ධනය තහවුරු කෙරේ. මෙය ප්‍රකාශිත ලාභාංශ අනුපාතය (ගාස්තු හර කිරීමෙන් අනතුරුව) හෝ වාර්ෂිකව සහතික කරන ලද ආදායම් අනුපාතය (ගාස්තු හර කිරීමෙන් අනතුරුව) යන දෙකින් වඩාත් ඉහළ අගය විය හැක. වෙන්කිරීමේ ගාස්තු අඩු කිරීමෙන් අනතුරුව මූලික වාරික සහ අමතර වාරික බැර කෙරෙන්නා වූ ඔබේම ආයෝජන ගිණුමක් මෙහිදී ඔබ සතු වේ.

**ඔබේ අරමුදල වර්ධනය වන ආකාරය. නිදසුනක්:**
35 වන වියේදී (2019 වසරේදී/ඊළඟ උපන් දිනයේදී), ඔබ වසර 6 ක වාරික ගෙවීමේ කාලසීමාවක් සහ වසර 20 ක රක්ෂණාවර කාලසීමාවක් තෝරාගෙන, වාර්ෂික මූලික වාරිකය මෙන් 20 ගුණයක ජීවිත ප්‍රතිලාභයක් සඳහා රු.250,000 ක වාර්ෂික වාරිකයක් ගෙවනු ලබන්නේ යැයි උපකල්පනය කරන්න.

කල්පිරීමේදී ඔබේ නිදර්ශිත අරමුදල පහත දැක්වෙන පරිදි වේ:

| අරමුදල් විස්තර | උපකල්පිත ලාභාංශ අනුපාත (අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | | |
|---|---|---|---|
| | 4 % වාර්ෂිකව | 8% වාර්ෂිකව | 12% වාර්ෂිකව |
| කල්පිරීමේදී නිදර්ශිත අරමුදල | 2,364,562 | 4,256,744 | 7,719,063 |

ඔබ විසින් කල්පිරීමේ ප්‍රතිලාභය වසර 15 ක කාලසීමාවක් සඳහා මාසික ආදායමක් වශයෙන් ලබාගැනීම තෝරා ගනු ලැබුවහොත්, නිදර්ශිත මාසික ආදායම පහත දැක්වෙන පරිදි වේ:

| නිදර්ශිත මාසික ආදායම | උපකල්පිත ලාභාංශ අනුපාත (අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින්) | | |
|---|---|---|---|
| | 4 % වාර්ෂිකව | 8% වාර්ෂිකව | 12% වාර්ෂිකව |
| ලාභාංශ වර්ධනය (Dividend Booster) සමග නිදර්ශිත ලාභාංශ ප්‍රතිශත | 5.2% වාර්ෂිකව | 10.4% වාර්ෂිකව | 15.6% වාර්ෂිකව |
| 56 වන වියේදී | 13,136 | 23,649 | 42,884 |
| 61 වන වියේදී | 16,331 | 37,484 | 85,693 |
| 66 වන වියේදී | 20,303 | 59,414 | 171,239 |
| 70 වන වියේදී | 24,166 | 85,887 | 297,938 |
| **ආදායම හිමි වන කාල පරිච්ඡේදයේදී සම්පූර්ණ ආදායමේ වටිනාකම** | **3,264,120** | **8,770,096** | **24,185,716** |

වැදගත් උපකල්පන සහ සටහන්:

ඉහත වගුවල දැක්වෙන අනුමානිත අගයන් ගණනය කරනු ලැබ ඇත්තේ 4%, 8% සහ 12% උපකල්පිත ලාභාංශ අනුපාතයන් යොදාගනිමින් සහ අදාළ ගාස්තු භාවිත කොට සියලුම වාරික නියමිත දිනයන්හිදී ගෙවනු ලැබ ඇති බවට උපකල්පනය කරමිනි.

මෙම උපකල්පිත ලාභාංශ අනුපාතයන් සහතික කරනු නොලබන අතර, එමගින් ඔබ වෙත හිමි විය හැකි උපරිම හෝ අවම සීමාවන් නිරූපනය නොකෙරේ.

ඉහත නිදර්ශිත විශ්‍රාම ප්‍රතිලාභයට අමතරව, ඔබගේ රැකවරණ ප්‍රතිලාභ පහත දැක්වෙන පරිදි වේ:

| අන්තර්ගත ප්‍රතිලාභ | මුදල (අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින්) |
|---|---|
| පළමු රක්ෂණවර වසර තුළ මරණය සිදුවුවහොත් ගෙවනු ලබන මුදල (මූලික වාරිකය මෙන් 120%) | 300,000 |
| පළමු රක්ෂණවර වසරින් පසුව රක්ෂණවර කාල සීමාව තුළ ස්වාභාවිකව මරණය සිදුවුවහොත් ගෙවනු ලබන මුදල | 5,000,000 |
| ඔප්පුවේ පළමු වසර ඉක්මවා ඇත්නම් ඔප්පු කාල සීමාව ඇතුළත හදිසි අනතුරක් නිසා සිදුවන මරණයකදී ගෙවනු ලබන මුදල | 10,000,000 |
| වාරික ආරක්ෂණ ප්‍රතිලාභය | මරණය හෝ පූර්ණ සදාකාලික අකර්මණ්‍යතා අවස්ථාවකදී ඔබ විසින් වාරික ගෙවීමේ අවශ්‍යතාවය නොසළකා හැරේ. කෙසේවුවද රක්ෂණවරය මගින් රක්ෂණවර කාලසීමාව පුරා අඛණ්ඩව ප්‍රතිලාභ සැලසෙනු ඇත. |

**ලෝයල්ටි ප්‍රසාද තිළිණ**

පහත දැක්වෙන පරිදි ඔබ විසින් තෝරාගනු ලබන වාරික ගෙවීමේ කාලසීමාව සහ රක්ෂණවර කාලසීමාව අනුව ඔබේ මූල්‍යමය වගකීම උදෙසා ඔබේ මූලික වාර්ෂික වාරිකය මෙන් 370% ක් දක්වා වන ලෝයල්ටි ප්‍රසාද තිළිණයක් ඔබ වෙත හිමි වේ.

| වාරික ගෙවීමේ කාලසීමාව | වසර 20 සැලසුම | | | | වසර 10 සැලසුම |
|---|---|---|---|---|---|
| | වසර 15 | | වසර 20 | | වසර 10 |
| | 6 ගෙවීම | 4 ගෙවීම | 6 ගෙවීම | 4 ගෙවීම | 4 ගෙවීම |
| වාර්ෂික | 320% | 220% | 50% | 43% | 120% |
| අර්ධ වාර්ෂික | 320% | 220% | 50% | 43% | 120% |
| ත්‍රෛමාසික | 260% | 160% | 50% | 43% | 100% |
| මාසික | 260% | 160% | 50% | 43% | 80% |

**සැලසුම පිළිබඳ වෙනත් විස්තර**

ඇතුළත්වීමේ වයස: අවුරුදු 19 - 61 (ඊළඟ උපන් දිනට)
උපරිම කල්පිරීමේ වයස: අවුරුදු 76 (ඊළඟ උපන් දිනට)

**වාරික ගෙවීමේ කාලසීමාව**

වසර 4 හෝ වසර 6

**රක්ෂණවර කාලසීමාව**

6 ගෙවීම - වසර 20, 4 ගෙවීම වසර 10 හෝ වසර 20

**අවම වාර්ෂික වාරිකය**

රු.150,000 වාර්ෂිකව
අවම ටොප්-අප් (Top-up): රු. 25,000

## අදාළ ගාස්තු

**වාරිකය මත වෙන්කිරීමේ ගාස්තුව**

(රක්ෂණාවර අරමුදල් වෙත වෙන්කිරීමට පෙරාතුව වාරිකයෙන් අඩු කරගැනේ).

| රක්ෂණාවර වසර | 1 වසර | 2 වසර | 3 වසර සිට |
|---|---|---|---|
| මූලික වාරිකය මත වෙන්කිරීමේ ගාස්තුව | 60% | 25% | 0% |
| අමතර වාරිකය මත වෙන්කිරීමේ ගාස්තුව | 0% | | |

**පවාරණ ගාස්තු**

| රක්ෂණාවර වසර | 1 වැනි | 2 වැනි | 3 වැනි | 4 වැනි වසර සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තු | 100% | | | 4 වන වසරේ සිට 10 වන වසර දක්වා 100% සිට 0% දක්වා පවාරණ ගාස්තු ක්‍රමිකව හීන වේ.<br>වසර 10න් පසු පවාරණ ගාස්තු නොමැත. |

**පරිපාලන ගාස්තුව:**

2018 සඳහා වසරකට රු.805 ක් වන අතර එක් එක් වසරෙහි ජනවාරි 1 වැනි දින වසරකට 15% බැගින් ඉහළ යයි.

**අරමුදල් කළමනාකරණ ගාස්තුව:**

වසරකට ආයෝජන ගිණුමෙහි ශේෂයෙන් 0.75%

**මෘත්‍යතා ගාස්තුව:**

ජීවිත රක්ෂණ ප්‍රතිලාභය සහ සමාගමෙහි ගාස්තු ආවරණ පිරිවැය මිල ගණන් මත පදනම් වේ.

**වාරික මාදිලි ගාස්තුව:**

මාසික වාරික මාදිලිය සඳහා පමණක් 4%.

**නීතිරීති හා කොන්දේසි:**

ජීවිත රක්ෂිතයා රක්ෂණාවරහිමියා නොවන්නේනම් මෙම රක්ෂණාවරය මගින් සපයනු ලබන ප්‍රතිලාභ රක්ෂණාවරහිමියා වෙත අදාළ වන අතර ආවරණයන් ජීවිත රක්ෂිතයා වෙත අදාළ වේ.

මෙම සැලසුම ලබාගත හැකි වන්නේ බලපත්‍රලත් AIA වෙල්ත් ප්ලැනර් වරයෙකු හෝ මූල්‍ය සැලසුම් විධායක නිලධාරියකුගෙන් පමණි.

මෙය සැලසුම පිළිබඳ දළ විස්තරයක් පමණි. සම්පූර්ණ සැලසුම් විස්තර සහ නීතිරීති හා කොන්දේසි සඳහා කරුණාකර රක්ෂණාවර ඔප්පුව බලන්න.

SW - 300000381
V1 - 12/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919 චීනය

1931 හොංකොං

1931 සිංගප්පූරුව

1938 තායිලන්තය

1947 පිලිපීනය

1948 මැලේසියාව

1957 බෲනායි

1972 ඕස්ට්‍රේලියාව

1981 නවසීලන්තය

1982 මැකාවු

1984 ඉන්දුනීසියාව

1987 කොරියාව

1990 තායිවානය

2000 වියට්නාමය

2001 ඉන්දියාව

2012 ශ්‍රී ලංකාව

2013 මියන්මාරය*

2015 කාම්බෝජය

*මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 ක** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 32 කට** අධික තනි පුද්ගල රක්ෂණාවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com

HEALTHIER, LONGER, BETTER LIVES

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලද: 12/2018